# හියුං සියංගේ භ්‍රමණ වෘතාන්තයෙන් හෙළිවන ශ්‍රී ලාංකේය ඉතිහාසය : සාහිත්‍ය සහ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ඇසුරින් කෙරෙන අධ්‍යයනයක්

*හර්ෂණී, පී. ජී. ආර්. ජේ. එන්.* [1]

ඉතිහාසය හැදෑරීමේ මූලාශ්‍රය, සාහිත්‍ය මූලාශ්‍රය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකිය. දේශීය මෙන්ම විදේශීය වාර්තා සාහිත්‍ය මූලාශ්‍රය ගණයට අයත් වේ. විදේශීය වාර්තා ගණයෙහිලා සැලකෙන චීන ජාතික හියුං සියං හිමි විසින් රචිත භ්‍රමණ වෘතාන්තය තුළින් ලංකා ඉතිහාසය සම්බන්ධ වැදගත් කරුණු අනාවරණය කර ගැනීමට හැකිය.

ක්‍රි. ව. 603 චීන ජාතික හියුං සියං හිමි උපත ලබා ඇත. තෙළෙස් වියේදී පැවිදි වී උපසම්පදාව ලැබීමෙන් අනතුරුව සිය දේශාටනය ඇරඹූ උන්වහන්සේ ඉන්දියාවට පැමිණ එහිදී තමා දුටු දේ මෙන්ම ඇසූ විරූ දේ සිය භ්‍රමණ වෘතාන්තයෙහි අන්තර්ගත කර තිබේ. චීන අධිරාජයාගේ ඉල්ලීම පරිදි මෙම වාර්තාව හියුං සියං හිමි රචනා කර ඇතැයි කියැවේ. පරිච්ඡේද 12කින් සමන්විත මෙම භ්‍රමණ වෘතාන්තයෙහි නොයෙක් දේශවල භූමි විස්තර, මිනිසුන්ගේ ස්වරූපයන්, ඇතැම් රජුන් පිළිබඳ විස්තර, බෞද්ධ සිද්ධස්ථාන එවක පැවති ආකාරය යනාදි තොරතුරු ඉදිරිපත් කර ඇත. ලංකාවට හියුං සියං හිමි නොපැමිණියද දකුණු ඉන්දියාවට පැමිණ සිටි කාලයෙහි ලක්දිවින් ගිය භික්ෂු පිරිසක් හමු වී ඔවුන්ගෙන් ලංකාව පිළිබඳව දැනගත් තොරතුරු සිය වාර්තාවෙහි සඳහන් කර ඇත.

හියුං සියං හිමියන් විසින් රචිත භ්‍රමණ වෘතාන්තයෙන් ශ්‍රී ලංකාව පිළිබඳවද වැදගත් කරුණු රාශියක් අනාවරණය වේ. මෙකී තොරතුරු සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ඇසුරින් සංසන්දනයට ලක් කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණයි. මෙහිදී ක්‍රමවේදය වශයෙන් පර්යේෂණ මාතෘකාවට අදාළ ප්‍රාථමික සාහිත්‍ය මූලාශ්‍රය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ඔස්සේ කරුණු ඒකරාශී කරනු ලැබිණි. සිංහලයාගේ උපත, ලාංකීක ජනයාගේ ස්වරූපය ලංකාවේ දේශගුණය හා ගස්-වැල්, මිහිඳු හිමියන්ගේ පැමිණීම, නිකාය බෙදීම, දළදා මාලිගාව, මහාපාලි දන්සැල, මුතුපර, ලංකාවතාර සූත්‍රය දේශනා කිරීම යනාදි කරුණු රාශියක් භ්‍රමණ වෘතාන්තය නම් දේශාටන වාර්තාව තුළින් හෙළි වේ. හියුං සියං හිමි සිය වාර්තාව තුළ ලංකාව සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති තොරතුරු,

සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය මගින් සංසන්දනාත්මකව විමසීමෙන් එකී තොරතුරුවල ප්‍රාමාණිකත්වය අනාවරණය කරගැනීම මෙම පර්යේෂණයෙන් අපේක්ෂිතය.

**ප්‍රමුඛ පදඃ** හියුං සියං හිමි, දේශාටනය, භ්‍රමණ වෘතාන්තය, ලංකාව

[1]*ඉතිහාස අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව. nisansalaharshani200@gmail.com*